LOLC
imagine
the possibilities

# LOLC Holding PLC වෙතින් කෙරෙන මහජන දැනුම්දීමයි

www.Lankaenews.com නමැති වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ලිපියක් සහ ඊට සමගාමීව "සිවිල් බුද්ධි පෙරමුණ" නම් සංවිධානයක නිලධාරියෙකු විසින් අපගේ නියෝජ්‍ය සභාපතිවරයාට සහ ඔහුට සම්බන්ධ ව්‍යාපාරික ආයතනවලට එරෙහිව සිදුකරන අපහාසාත්මක ප්‍රකාශ මාධ්‍ය සටහන් වෙත අපගේ අවධානය යොමු වී තිබේ. මෙම ලිපි සහ මාධ්‍ය සටහන් වල අන්තර්ගතයේ සත්‍යතාව පිළිබඳව අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්, ගනුදෙනුකරුවන් සහ ජනතාව වෙතින් විමසීම් ලැබී ඇති අතර ඊට පිළිතුරු ලෙස පහත ප්‍රකාශය ඉදිරිපත් කරමු.

lankaenews.com ශ්‍රී ලංකාවෙන් පිටත සිට ක්‍රියාත්මක වන අතර, නිරන්තරයෙන් අපහාසාත්මක ලිපි ප්‍රකාශයට පත් කිරීමට ප්‍රසිද්ධ වෙබ්අඩවියක් බවත් අපි පෙන්වා දීමට කැමැත්තෙමු. එබැවින් එහි ලිපියකට ප්‍රතිචාර දක්වා ගෞරවනීයත්වයක් දැක්විය යුතු යැයි අපි විශ්වාස නොකරමු. කෙසේ වෙතත්, මාධ්‍ය සටහන ආරම්භ වන්නේ පුළුල් නීත්‍යානුකූල කොටස්කරුවන් පිරිසක් නියෝජනය කරන කණ්ඩායමක් විසින් පවත්වන ලද විධිමත් මාධ්‍ය හමුවකින් වන නිසා ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතුවේ.

එබැවින්, ඉහත සඳහන් මාර්ගගත ලිපියේ සහ මාධ්‍ය සටහන් මගින් කර ඇති චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරන අතර, ඒවායේ අංශු මාත්‍රයක් හෝ සත්‍ය අඩංගු නොවන බව අපි අවධාරණය කරමු. මෙම ලිපියේ සඳහන් ඉෂාර ට්‍රේඩර්ස් ආයතනය, 2018 වසරේ සිට වාහන ආනයනය නතර කර ඇති අතර, ඉෂාර ට්‍රේඩර්ස් හෝ LOLC සමූහයේ කිසිදු සමාගමක් කිසි විටෙකත් වාහන, කොටස් වශයෙන් වාහන හෝ මෝටර් රථ අමතර කොටස් ආනයනය කිරීමේ නිරත වී නොමැත.

අවසාන වශයෙන්, ඉහත සඳහන් කළ "සිවිල් බුද්ධි පෙරමුණ" නැමැති සංවිධානයේ නිලධාරී මණ්ඩලයට මෙන්ම lankaenews.com ප්‍රකාශකයාට එරෙහිව සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අපගේ නීති උපදේශකවරුන්ට උපදෙස් ලබාදී ඇති බව අපගේ කොටස්කරුවන්, පාර්ශවකරුවන් සහ ජනතාව වෙත දැනුම් දෙමු.

කිත්සිරි ගුණවර්ධන
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - LOLC සමූහ ව්‍යාපාරය

LOLC Holdings PLC
Company Registration No: P Q 70
No. 100/1, Sri Jayawardenepura Mawatha, Rajagiriya, Sri Lanka
Tel: 5880880 Fax: General: 2865606 Marketing: 2868648, 2865612, 2865641 Finance: 2865642 Website: www.lolc.com